# මුව පැංචාට පාඩමක්



දුලන්යා ඉදුමිනි ද සිල්වා

කෘතියේ නම - මුව පැංචාට පාඩමක්

ප්‍රථම මුද්‍රණය - 2023.12.06

කතාව සහ චිත්‍ර - දුලන්යා ඉදුමිනි ද සිල්වා

කතෘගේ ලිපිනය - අංක 83/26 ඒ,
අම්පිටිය පාර,
මහනුවර.

පාසල - මහාමායා බාලිකා විදුහල,
මහනුවර.

ශ්‍රේණිය - 1 ශ්‍රේණිය A

ISBN 978-624-206-977-7

# පිදුම...

සැමදාම මා එනතුරු පාසල ළඟ

මඟ බලා සිටි ආදරණීය

ආච්චි අම්මාට සහ සීයාට

සහ

පොතක් ලිවීමට දිරිය දුන්

මහාමායා බාලිකා විදුහලේ

1 ශ්‍රේණිය -A පන්තියේ

ආර්.එම්. දමයන්ති ගුරු මැණියන්ට

පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතා-වයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේ-ක්ෂාවයි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලිය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි.

එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සමාජයෙන් උරුම කර ගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය පොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂි ජයක්ග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවන් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතේට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතරවිද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමී

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි වේග ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටද ශක්තියක් වේවා යි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාක-රණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමටම ස්තුතිය මෙමගින් පිරිනමමී.

සසිකලා සේනාධීර,
විදුහල්පතිනි,
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01

එකමත් එක කැලයක මුව
පවුලක් ජීවත් වුණා.
අම්මයි, තාත්තයි, පුතයි.





එක දවසක් පුංචි මුව පැංචා අම්මාගෙන් ඇහුවා. "අනේ ! මට කැලයේ ඇවිදින්න යන්න දෙනවා ද?" කියලා.

අම්මා කිව්වා කැලයේ නපුරු සත්තු ඉන්න නිසා කැලයේ තනියම ඇවිදින එක භයානකයි කියලා.

කැලයේ කෑම සොයන්න ඇවිදලා මහන්සි නිසා දැන් ටිකක් නිදාගමු'යි කියලා මුව අම්මා මුව පැංචාට කිව්වා.



අම්මටයි තාත්තටයි නින්ද යනකන්
සිටිය චුටි පැටි මුවා ..

අම්මටයි තාත්තාටයි හොරෙන්
හිමිහිට හිමිහිට කැලේට ගියා.

කැලය ඇතුලේ ලස්සන බලන ගමන්
චුටි මුව පැටියා කැලේ ඇතුලට
ගියා.



“දැන්නම් ටිකක් මහන්සි වගේ. ටිකක් වෙලා නිදාගත්තා නම් හොඳයි ” කියලා චුටි මුව පැටියා ගහක් ළඟට ගියා.



එතකොට එයා දැක්කා ගහ යට නිදාගෙන ඉන්න කොටියාව.





කොටියාව දැකපු ගමන්
හොඳටම බය වුන මුව
පැටියා කෑගහගෙන
දුවන්න පටන් ගත්තා.

බයවෙලා දුවපු මුව පැටියා
ලෙස්සලා ගිහින් වැටුණා.
වැටුණ පාරට මුව පැටියාගේ
කකුල හොඳටම තුවාල වුණා.

මුව පැටියා කෑගහන
සද්දේ ඇහුන මුව
අම්මයි තාත්තායි එතනට
දුවගෙන ආවා.

මුව අම්මයි තාත්තායි මුව පැටියාට නැගිටින්න උදව් කළා. තුවාල වලට බෙහෙත් දැම්මා.

“සමාවෙන්න අම්මේ.” චුටි මුව පැටියා අම්මාට කිව්වා.



ඊට පස්සේ චුටි මුව පැටියා
අම්මටයි තාත්තාටයි කිකරුව
සතුටින් හිටියා.



# පසුවදන



නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපන දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමා-ජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමී. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර බවය ලෝකය දිනන ගත්කතුවරයෙක් වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,<br>
සෙනවිරත්න මහාලේකම්,<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ.

ISBN 978-624-206-977-7